# ඉදිරි මැතිවරණවලට සුදුසු අය තෝරා ගැනීම පක්ෂ නායකයන්ගේ වගකීමක් හා යුතුකමක්

## මල්වතු මහානායක හිමියෝ පැෆරල් සංවිධානයට කියති

ගයා වන්නිආරච්චි

**ඉදිරි** මැතිවරණවලදී දේශපාලනයට සුදුසු අය තෝරා ගැනීම පක්ෂ නායකයින්ගේ යුතුකමක් හා වගකීමක් බව මල්වතු පාර්ශ්වයේ මහනාහිමි අතිපූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහනාහිමියෝ පැවැසූහ.

පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා ඇතුළු පිරිසක් පෙරේදා (22) වන දින මල්වතු පාර්ශ්වයේ මහ නාහිමියන් බැහැදැක ආශිර්වාද ලබා ගැනීමෙන් අනතුරුව දේශපාලන නායකයින් විසින් අපේක්ෂකයින් තෝරා ගනු ලබන අවස්ථාවේදී එම තේරීම් පිළිබඳ මූලික නිර්ණායකයන් ඇතුළත් සංදේශයක් මහානාහිමියන්ට භාර දීමට කටයුතු කළහ.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ මල්වතු පාර්ශ්වයේ මහනාහිමියන් සඳහන් කළේ දේශපාලනයට සුදුසු අය තෝරා පත් කර එවීම පක්ෂ නායකයින්ගේ යුතුකම හා වගකීම බවයි. මැතිවරණයට යම් අපේක්ෂකයෙක් පත් කළ විට ඔහු පිළිබඳ මනා අවබෝධයක් ජනතාවට නොමැති නිසා ජනතාව ඔවුන්ට ඡන්දය දීමට පෙළ ඹෙන බවද මහ නාහිමියෝ කීහ. එම නිසා මේ පිළිබඳව දේශපාලන පක්ෂ නායකයින් දැනුවත් කිරීම වැදගත් බවත් දැන් පවතින මනාප ක්‍රමය නිසා බොහෝ අය අයුතු අන්දමින් මුදල් සෙවීමට පෙළඹෙන බවත් මහානාහිමියෝ කීහ.

මෙහිදී පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේ පැෆරල් සංවිධානය වසර තිහක් පමණ මැතිවරණ නිරීක්ෂණ කටයුතු සිදුකරන බවයි. පසුගිය දශක කීපය තුළ මෙරට දේශපාලන සංස්කෘතිය බරපතළ සෝදා පාලුවකට ලක්වී ඇති බව එහිදී පෙනී ගිය බවද ඔහු පැවැසීය. පසුගිය වසර එකහමාරක පමණ කාලයක් තුළ පක්ෂ විපක්ෂ කිසියම් වූ මහජන නියෝජිතයෙකුට යම් චෝදනාවක් එල්ලවී තිබෙන බවද ඔහු පැවැසීය. එම නිසා මේ සම්බන්ධව රට පුරා විවිධ තරාතිරමේ පුද්ගලයින් විද්වතුන් හා සමාජ ක්‍රියාකාරීන් සමග සංවාදයක් ගෙන ගිය බවද ඔහු කීය.

අප රටේ මහජන නියෝජිතයෙකුට තිබිය යුතු මූලික සුදුසුකම් පිළිබඳ නිර්ණායකයක් නැති බව එහිදී හෙළි වූ බවද රෝහණ හෙට්ටිආරච්චි මහතා කීය. එම නිසා පාර්ලිමේන්තු, පළාත් සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා යන පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයෙකුට අවම වශයෙන් තිබිය යුතු පොදු සුදුසුකම් පිළිබඳව සාකච්ඡා කළ බවත් ඒ පිළිබඳ වාර්තාව ලබන 12 වන දින ආගමික නායකයින් සමග ඒකාබද්ධව සියලුම දේශපාලන නායකයින්ට භාරදීමට කටයුතු කරන බවත් ඔහු මහනාහිමියන්ට පැවැසීය. මේ පිළිබඳව ලබන මැතිවරණයේදීවත් සලකා බලන්නැයි එම පක්ෂ නායකයින්ගෙන් ඉල්ලීමක් කිරීමට අදහස් කරන බවද ඔහු පැවැසීය. ඉන් අනතුරුව ප්‍රාදේශීය මට්ටමින් මෙය ජනතාවට ලබා දී මේ ගැන සැලකිලිමත් වන ලෙස ජනතාව දැනුවත් කරන බවද හෙතෙම සඳහන් කළේය. ඒ අතරතුර ඉතා කෙටි කාලයක් ඇතුළත මැතිවරණ ක්‍රමයක් වෙනස් කරන්න බලපෑම් කිරීමට කටයුතු කරන බවද ඔහු මහනාහිමියන්ට පැවැසීය.

මෙහිදී අදහස් දැක්වූ පැෆරල් සංවිධානයේ අධ්‍යක්ෂ ඇත්කඳවක සද්ධාජීව හිමියන් කියා සිටියේ ආගමික නායකයින් මේ පිළිබඳව දේශපාලන නායකයින්ට බලපෑම් කළේ නැතිනම් ඒ අය තමන්ට කැමති අය මැතිවරණයට ඉදිරිපත් කරන බවය. අප යම් දෙයක ප්‍රතිඵල ගැන කතා කරනවාට වඩා එයට හේතුව සොයා පිළියම් යෙදීම වැදගත් බවද උන්වහන්සේ සඳහන් කළහ.

මෙම අවස්ථාවට දෙගෝඩය සංවිධානයේ රවී කන්දගේ මහතාද එක්ව සිටියහ.



පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා විසින් දේශපාලන අපේක්ෂකයින් තෝරා ගනු ලබන මූලික නිර්ණායකයන් ඇතුළත් සංදේශයක් මල්වතු පාර්ශ්වයේ මහනාහිමි තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහ නාහිමි වෙත භාර දුන් අයුරු